තාක්ෂණ අමාත්‍යාංශය
தொழில்நுட்ப அமைச்சு
Ministry of Technology

mot.gov.lk

වාර්ෂික කාර්යය සාධන වාර්තාව

2022

ශ්‍රී ලංකා ජනාධිපති

පණිවුඩය

2022 වසර සඳහා තාක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශයින්ම සතුටට පත් වෙමි. තාක්ෂණය පදනම් කර ගත් සමාජයක් නිර්මාණය කිරීමට අරමුණු කිරීම ජාතික ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය සමඟ හොඳින් ගැලපේ. ශක්තිමත් ආයතනික රාමුවක් තුළින් ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වලට මෙහෙයවීම හා සම්බන්ධීකරණය සපයමින් අමාත්‍යාංශය ජාතික ඩිජිටල් මාර්ග සිතියම කාර්යයක්ෂම ලෙස හසුරුවා ඇත.

ප්‍රධාන සේවාවන් කඩිනමින් ස්වයංක්‍රීය කිරීමට රාජ්‍ය අංශය යොදා ගනිමින් තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඩිජිටල් රජය හා ආර්ථික ඇරඹුම් මෙහෙයවනු ලබයි. ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම වැනි ඇරඹුම් මගින් ඩිජිටල්මය වශයෙන් හැකියා සහිත රාජ්‍ය සේවාවක් සපයනු ඇත. ඩිජිටල්කරණය වේගවත් කිරීම සඳහාත්, ආවරණය කිරීම හෝ ප්‍රමාදයන් වලකාලීම සඳහාත් අවශ්‍ය වන්නේ නම් අනුකූල නොවීම උදෙසා දඬුවම්ද සමඟින් අනුකූලතාව හා වගවීම සහතික කරනු වස් ව්‍යවස්ථා සම්පාදනය ඉතා වැදගත්වේ.

තාක්ෂණ අමාත්‍යාංශයේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලබන "ගමට සන්නිවේදය - Connect Sri Lanka" ව්‍යාපෘතිය විසින් ITU Connect 2030 Agenda සමඟ පෙළ ගැසෙමින් දීපව්‍යාප්ත බ්‍රෝඩ් බෑන්ඩ් ජාලය පුළුල් කිරීම සඳහා කර්මාන්ත ඇරඹුම් සමඟ ග්‍රාමීය සබඳතාව මෙහෙය වනු ලබයි. මීට අමතරව අමාත්‍යාංශය විසින් කාර්මික ස්වයංක්‍රීයකරණයේදී අනාගත වාණිජකරණය IoT ලීවරණය (leverage) කිරීමට අරමුණු කරගනිමින් සියළු ජංගම දුරකථන මෙහෙයවන්නන් හරහා 5G අත්හදා බැලීම් දියත් කරනු ලබයි.

සීඝ්‍ර ඩිජිටල් පරිවර්තනය මධ්‍යයේ, ආරක්ෂාකාරී ආණ්ඩුකරණයක් සහ ඩිජිටල් පරිසරයක් සහතික කිරීම ඉතා වැදගත්වේ. පුරවැසි දත්ත ආරක්ෂා කිරීමේ අරමුණ සහිතව පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඇතුළුව ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

සයිබර් ආරක්ෂණ ව්‍යවස්ථා සම්පාදන රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනිමින් අමාත්‍යාංශය විසින් සයිබර් ආරක්ෂණ සූදානම වෙත ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. මීට අමතරව 2023 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රබලවම අපේක්ෂා කරනු ලබන ඩිජිටල් ආර්ථිකය සඳහා DIGIECON 2030 ප්‍රධාන සැලැස්ම මගින් අන්තර්ගත ඩිජිටල් ආර්ථිකයක් වෙත රට පරිවර්තනය කිරීම සඳහා නියාමන රාමුවක් හඳුන්වා දීමට අරමුණු කෙරේ.

ජාතික ඩිජිටල් පරිවර්තන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමෙහිලාත්, මෙම අරමුණු 2022 වසරේදී සාක්ෂාත් කර ගැනීමෙහිලාත් ලබා දුන් සහායෝගය වෙනුවෙන් තාක්ෂණ අමාත්‍යාංශයේ හා ඒ හා ඒකාබද්ධ ආයතනයන්ගේ සියළු නිලධාරින් වෙත මගේ ස්තුතිය පුද කරමි.

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති
2024 පෙබරවාරි 29 වෙනි දින

ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයතාක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ පණිවිඩය

ජාතික සංවර්ධන රාමුව පදනම් කර ගනිමින්, සෞභාග්‍යමත් ජාතියක් කරා ඵලදායි පුරවැසියෙකු, තෘප්තිමත් පවුලක්, විනයගරුක සහ සාධාරණ සමාජයක් යන සිව්වැදෑරුම් ප්‍රතිඵලයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා අමාත්‍යාංශයේ ප්‍රධාන ප්‍රතිපත්තියක් වන්නේ තාක්ෂණය පදනම් කර ගත් සමාජයක් නිර්මාණය කිරීමයි.

ඉහත ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ගැනීමේදී අනාගත සුහුරු සමාජයක් සඳහා ඩිජිටල් ආර්ථිකයකින් පෝෂණය වූ ඩිජිටල්මය වශයෙන් අන්තර්ගත සුහුරු ශ්‍රී ලංකාවක ජාතික පරමාර්ථය ස්ථාපිත වූ අතර ජාතික ප්‍රමුඛතා සඳහා ජාතික මට්ටමින් මඟ පෙන්වීමෙන් හා සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක වන ආයතන හඳුනා ගන්නා ලදි. සමස්ත දිශානතිය සහතික කිරීම සහ ශක්තිමත් ආයතනික රාමුවක් හරහා ජාතික ඩිජිටල් පරිවර්තන මාර්ග සිතියම මෙහෙයවීමේදී ආයතන අතර ශක්තිමත් සහජීවනයක් සහ එකඟතාවයක් ඇති කිරීම සඳහා ඒ තුළ ඒකාබද්ධ කර පොදු ආයතනයක් යටතට ගෙන ඒම සඳහා අවශ්‍ය ප්‍රධාන ප්‍රමුඛතා ආයතන ලෙස පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ශ්‍රී ලංකා පරිගණක හදිසි සුදානම් කණ්ඩායම (CERT), සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) යන සියල්ල හඳුනා ගනු ලැබූ අතර ඒ අනුව තාක්‍ෂණය අමාත්‍යාංශය පිහිටුවා එය 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

වඩාත් පුරවැසි හිතකාමී බවට පත් කිරීම සඳහා රජයේ මෙහෙයුම් විධිමත් කිරීම සහ ඩිජිටල්කරණය කිරීම එක් ප්‍රධාන ඇරඹුමක් වනු ඇත. ඉදිරි වසර සඳහා සැලසුම් කර ඇති ඩිජිටල් හැඳුනුම මෙම සැලැස්ම යථාර්ථයක් බවට පත් කිරීමේ මූලික විසඳුම ලෙස ක්‍රියා කරනු ඇත. 2025 වසර වන විට සැලසුම් කර ඇති ඇමෙරිකානු ඩොලර් බිලියන තුනක අපනයන ඉපැයීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ආයතනික අංශය සහ විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ / BPM කර්මාන්තය උදෙසා බොහෝ දිරිගැන්වීම් ලබා දී ඇත. දැනටමත් ආරම්භ කර ඇති අනෙකුත් කැපී පෙනෙන ව්‍යාපෘති වන්නේ ලංකා රාජ්‍ය ජාලය 2.0, ලංකා රාජ්‍ය මේසය 2.0, Connect Sri Lanka (ගමට සන්නිවේදනය), සහ දිවයිනේ පාසල් 10,250 කට ෆයිබර් සම්බන්ධතාව ලබා දීමයි.

2022 අංක 9 දරන දත්ත ආරක්ෂණ පනත 2022 මාර්තු 19 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත. දත්ත ආරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වසරේදී දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීමට අමාත්‍යාංශය විසින් පියවර ගනු ඇත. ඩිජිටල්කරණයේ අහිතකර බලපෑමෙන් පුරවැසියාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා පුද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීමට මෙය උපකාර වනු ඇත.

2022 වසර තුළ ලබා දුන් නොමසුරු සහයෝගය වෙනුවෙන් විශේෂයෙන්ම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල අනෙකුත් සියලුම නිලධාරීන් වෙත මම ස්තූතිවන්ත වෙමි.

මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන
ලේකම්
තාක්ෂණ අමාත්‍ය

අන්තර්ගතය

01 පරිච්ඡේදය - තාක්ෂණ අමාත්‍යාංශය ... 1

1.1 හැඳින්වීම ... 1

1.2 දැක්ම ... 1

1.3 මෙහෙවර ... 1

1.**4** පරමාර්ථ ... 2

1.5 සංවිධාන සටහන ... 3

1.6 තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති විශේෂ ව්‍යාපෘති ... 3

1.6.1 ඒකීය ඩිජිටල් හැඳුනුම්පත (SLUDI) ... 3

(අ) හැඳින්වීම ... 3

1.සයිබර් අවකාශය තුළ පුද්ගලයකු (හෝ ආයතනයක්) අර්ථ දක්වන්නා වූ ඩිජිටල් සහතික කිරීමක්) ඩිජිටල් අනන්‍යතාවක් ... 3

2.අනන්‍ය ඩිජිටල් හැඳුනුමක් (UDI) නිර්මාණය කිරීම සඳහා අනන්‍යතාවක් සහ ආරක්ෂාවක් ක්‍රියාත්මක කිරීම සඳහා ඩිජිටල් අනන්‍යතාව සහිත ජෛවමිතින් එක් කිරීම ... 3

1.7 අනාගත සැලසුම් ... 5

දත්ත ආරක්ෂණ අධිකාරියක් (**DPA)** පිහිටුවීම ... 5

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම ... 5

ජයග්‍රහණ ... 5

අභියෝග ... 5

ඉදිරි ඉලක්ක ... 6

03 පරිච්ඡේදය-**2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය ... 7

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ... 7

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල සීමාව දක්වා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ... 7

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ... 8

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ... 8

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ... 9

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන ... 11

3.5 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය ... 12

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය ... 13

3.7 මු.රෙ. **208** ප්‍රකාරව මෙම අමාත්‍යාංශය වෙත වියදම් කිරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම් ... 13

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තාකරණයේ කාර්ය සාධනය ... 14

3.9 විගණකාධිපතිගේ වාර්තාව ... 15

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක ... 23

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ... 23

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (**SDG)** සපුරා ගැනීමේ කාර්ය සාධනය ... 24

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ... 24

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 26

ජයග්‍රහණ 26

අභියෝග 26

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 27

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 27

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම 27

6.3 මානව සම්පත් සංවර්ධනය 27

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 28

8. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) 36

8.1 ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ අනාගත සැලසුම් 36

9. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) 48

9.1 ව්‍යාපෘති සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය සහ අනාගත සැලැස්ම 48

සයිබර් ආරක්ෂණ කළමනාකරණය 51

10. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) 52

10.1 ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ව්‍යාපෘති සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය සහ අනාගත සැලසුම් 52

11. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) 53

11.1 ව්‍යාපෘතිවල සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය හා අනාගත සැලසුම් 53

12. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය (SLT) 55

12.1 ව්‍යාපෘති සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය සහ අනාගත සැලසුම් 55

අනාගත සැලසුම් - ශ්‍රී ලංකා ටෙලිකොම් 57

01 පරිච්ඡේදය - තාක්ෂණ අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙළින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) වගන්ති යටතේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඔහු විසින් 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නිවේදනය කර ප්‍රකාශයට පත් කර කලින් කලට සංශෝධනය කරන ලද පරිදි තාක්ෂණ අමාත්‍යාංශය පිහිටුවන ලද අතර සහ, 2022 ජූලි 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවදුරටත් සංශෝධනය කරන ලදි.

තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)
2. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ එහි අනුබද්ධ ආයතන
3. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT)
4. ශ්‍රී ලංකා ටෙලිකොම් සහ එහි අනුබද්ධ සමාගම් (SLT)
5. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

1.2 දැක්ම

"නවීන තාක්‍ෂණයෙන් සවිබල ගැන්වූ බුද්ධිමත් සමෘද්ධිමත් ජාතිය"

1.3 මෙහෙවර

සාමාජීය හා කාර්මික පරිවර්තනය තුළින් තාක්ෂණික දියුණුව, නවෝත්පාදන සහ සංවර්ධනය යන ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා තාක්ෂණය පදනම් කරගත් ප්‍රතිපත්ති, උපාය මාර්ග, ප්‍රමුඛතා, වැඩසටහන්, සැලසුම් සහ මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සහ පුනර්ජීවනය කිරීම.

1.4 පරමාර්ථ

I. රාජ්‍ය යාන්ත්‍රණය හා වෙළෙඳ පොළ ක්‍රියාවලිය සරල කරමින් කාර්යක්ෂම හා ජනතා කේන්ද්‍රීය සේවා සැපයීම හා දැනුම හුවමාරුවේ මෙවලමක් ලෙස තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ඩිජිටල් ආණ්ඩුකරණය පුළුල් කිරීම.

II. ජාත්‍යන්තර විද්‍යුත් වාණිජ්‍යය සහ ජාත්‍යන්තර ඉලෙක්ට්‍රොනික ගෙවීම් ක්‍රම ස්ථාපනය කිරීම.

III. රට පුරා විහිදුණු අධිවේගී දත්ත හුවමාරු පද්ධතියක් හා ඒ ආශ්‍රිත ජංගම ජාල පද්ධතිය පිහිටුවීම

IV. දත්ත ආරක්ෂණය, සයිබර් ආරක්ෂාව, බුද්ධිමය දේපල අයිතිය සඳහා නව නීති හා ආයතනික රාමුව සංවර්ධනය කිරීම

V. පරිසර සංවේදීතාව, තොරතුරු තාක්ෂණය, දැනුම හා නිපුණතා, සෞඛ්‍යය, සංචාරක ව්‍යාපාරය හා ක්‍රීඩා ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ සුවිශේෂත්වය ඉස්මතු කරමින් ඩිජිටල් ආණ්ඩුකරණය හා ආයතනික ව්‍යුහය සඳහා අවශ්‍ය නීති පද්ධතිය හා නියාමන රාමුව හඳුන්වාදීම.

VI. තාක්ෂණ ක්ෂේත්‍රයේ අපනයන දායකත්වය හා ජාතික ආර්ථිකයේ දැනුම හා වෘත්තීය සේවා දායකත්වය පුළුල් කිරීම සඳහා ව්‍යවසාය සංවර්ධනය, තාක්ෂණික යටිතල පහසුකම් හා ආශ්‍රිත සේවාවන් පුළුල් කිරීම මගින් තාක්ෂණික ව්‍යවසායමය ආර්ථිකයකට පරිවර්තනය කිරීම.

VII. අමාත්‍යාංශය යටතේ පවත්නා සංවර්ධන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

VIII. අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩල කළමනාකරණය සහ අමාත්‍යාංශයේ දැක්ම කරා ඒවා මෙහෙයවීම.

1.5 සංවිධාන සටහන



1.6 තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති විශේෂ ව්‍යාපෘති

1.6.1 ඒකීය ඩිජිටල් හැඳුනුම්පත (SLUDI)

(අ) හැඳින්වීම

- ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක දෙකකින් සමන්විත වේ.
    1. සයිබර් අවකාශය තුළ පුද්ගලයකු (හෝ ආයතනයක්) අර්ථ දක්වන්නා වූ ඩිජිටල් සහතික කිරීමක්) ඩිජිටල් අනන්‍යතාවක්
    2. අනන්‍ය ඩිජිටල් හැඳුනුමක් (UDI) නිර්මාණය කිරීම සඳහා අනන්‍යතාවක් සහ ආරක්ෂාවක් ක්‍රියාත්මක කිරීම සඳහා ඩිජිටල් අනන්‍යතාව සහිත ජෛවමිතීන් එක් කිරීම
- ඩිජිටල් සහතික කිරීම ජෛවමිතීන් සමඟ හොඳින් සම්බන්ධ කිරීමෙන් භෞතික වශයෙන් හෝ මාර්ගගත ආකාරයට බාධාවකින් තොරව සහතික කිරීමටත්, ගනු දෙනු කිරීමටත් පුරවැසියකු වෙත හැකියාව සලසා දෙනු ලබන **අනන්‍ය ඩිජිටල් හැඳුනුමක්** හිමි කර දෙයි.

- රජයේ නියෝජිතායතනයන් විසින් මෙහෙය වනු ලබන විවිධ "දත්ත පද්ධති" හරහා පුරවැසියකුට අදාළ සියළු දත්ත වෙත " අනන්‍ය දර්ශකය / යතුර" බවටද අනන්‍ය ඩිජිටල් අනන්‍යතාවය පත්වේ.

- අනන්‍ය ඩිජිටල් හැඳුනුම ක්‍රියාත්මක කිරීමේ දිගු කාලීන දැක්ම වන්නේ පුරවැසියකුට තමා පිළිබඳව වන තොරතුරු එකම එක් වතාවක් පමණක් ලබා දිය යුතු වීම සහතික කිරීමයි.

(ආ) ව්‍යාපෘතියේ පරමාර්ථ / ප්‍රතිලාභ

1. සියළු ශ්‍රී ලාංකික පුද්ගලයන් සඳහා එකම ජෛවමිතික පසුතලයකින් යුතු හැඳුනුම් පද්ධතියක් නිර්මාණය කිරීම

   අ. අනන්‍යතා කටයුතු කිරීම සඳහා වෙනත් අයට අවකාශ නොසැළසීම

2. අදාළ පුද්ගලයා ලෙස මාර්ගගත පද්ධති ප්‍රවේශයට අවකාශ සැලසීම සඳහා එක් එක් පුද්ගලයා සම්බන්ධයෙන් ඩිජිටල් අනන්‍යතාවක් නිර්මාණය කිරීම

   අ. සියලුම රජයේ ඩිජිටල් පද්ධති විසින් එම ඩිජිටල් අනන්‍යතාවට සහාය දැක්වීම අවශ්‍ය වේ.

   ආ. අභිමතය සහ / හෝ නිවේදනය කිරීමක් සහිතව රජය හරහා (සහ ඉන් ඔබ්බට) දත්ත හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම

3. සෑම පුද්ගලයෙකු සඳහාම අනිවාර්යයෙන්ම එක් ඩිජිටල් ද්විත්වයක් (හඳුනාගැනීමක්) සමඟින් ඩිජිටල් රාජ්‍ය වාස්තු ශිල්පයක් නිර්මාණය කිරීම හරහා ඩිජිටල් ආර්ථිකයට හැකියාව ලබා දීම

   අ. තොරතුරු කළමනාකරණය සඳහා වත්මන් නෛතික ව්‍යුහයට පහසුකම් සැලසීම සඳහා ඒකාබද්ධ කිරීම

   ආ. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙහි ඩිජිටල් රාජ්‍ය වාස්තු ශිල්පය මත පිහිටීම

- ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ සහ ඉන්දීය රජයේ නියෝජිතයන් සමඟ ඒකාබද්ධ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව (JPMC) පත් කරන ලදි.

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව (CAPC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත් කරන ලදි. - ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, සහායවීම සහ නඩත්තු කිරීම සඳහා ප්‍රධාන පද්ධති ඒකාබද්ධකරු (MSI) ප්‍රසම්පාදනය කිරීම.

- හැඳුනුම් පද්ධති ඒකාබද්ධකරු (ISI) බඳවා ගැනීම වෙනුවෙන් වන යෝජනාව (RFP) සඳහා ඉල්ලීම සකස් කරමින් පවතී.

1.7 අනාගත සැලසුම්

දත්ත ආරක්ෂණ අධිකාරියක් (DPA) පිහිටුවීම

2022 අංක 9 දරන දත්ත ආරක්ෂණ පනත 2022 මාර්තු 19 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත. දත්ත ආරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් 2022 දී දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීමට පියවර ගනු ඇත. ඩිජිටල්කරණයේ අහිතකර බලපෑමෙන් පුරවැසියාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම උදෙසා පුද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම සඳහා මෙය උපකාරී වනු ඇත.

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජයග්‍රහණ

තාක්ෂණ අමාත්‍යාංශය 2021 වසරේදී අළුතින් පිහිටුවන ලද ආයතනයකි. එමඟින් රටේ සමස්ථ තාක්ෂණ අංශයේ සංවර්ධනය ඉලක්ක කෙරේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ඩිජිටල් තාක්ෂණයන්, තාක්ෂණ ප්‍රතිපත්තීන් සහ ප්‍රමිතීන්, තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ ඩිජිටල් ආරක්ෂාව අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ ක්ෂේත්‍රයන් වේ.

මෙම සමාලෝචන කාල සීමාව තුළ ලබා ගත් ප්‍රධාන ජයග්‍රහණ ලෙස ඩිජිටල් රාජ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික සයිබර් ආරක්ෂාව, ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත වැඩිදියුණු කිරීම, දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමත කිරීම සහ අමාත්‍යාංශයේ විෂය පථයන් යටතේ පවත්නා විෂය ක්ෂේත්‍රයන්ගේ අනෙකුත් ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සංවර්ධනය දැක්විය හැකිය.

අභියෝග

බලධාරීන්ගෙන් ඉල්ලීම් කිහිපයක් කළද, අනුමත සේවක සංඛ්‍යාවට අනුව පැවතිය යුතු සම්පූර්ණ කාර්ය මණ්ඩලය ලබා ගැනීමට නොහැකි වී ඇත. කළමනාකරණ ශ්‍රේණිවල තුන්වන සහ හතරවන මට්ටම් සහ සහායක කාර්ය මණ්ඩලයේ බහුතරයක් තවමත් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ගත යුතුව ඇත.

අලුතින් පිහිටුවන ලද අමාත්‍යාංශයක් වීම හේතුවෙන් උපකරණ, වාහන සහ යන්ත්‍රෝපකරණ වැනි මූලික යටිතල පහසුකම් සපයා ගැනීම අත්‍යාවශ්‍ය වේ. එවැනි පහසුකම් බොහොමයක් තවමත් සපයා ගත යුතුව ඇත.

කාර්යාලය කොටස්වලට බෙදා වෙන් කිරීමේ කාර්යයට අදාළ ප්‍රසම්පාදනය, භාණ්ඩ හා සේවාවන්ගේ මිල ඉහළ යෑම හේතුවෙන් නියමිත වේලාවට අවසන් කර ගැනීමට අපහසු වී ඇත.

ඉදිරි ඉලක්ක

I. තාක්ෂණය මත පදනම් වූ සමාජයක් ගොඩනැගීමේ අරමුණින් අදාළ ආයතන මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම.

II. පුද්ගල කේන්ද්‍රීය ඩිජිටල් පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා මගපෙන්වීම සහ දායක වීම.

III. ජාත්‍යන්තර නවෝත්පාදන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා දායක වීම.

IV. ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක් ස්ථාපිත කිරීම සඳහා ඉලක්කගත වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

V. තාක්ෂණය පදනම් කරගත් රැකියා අවස්ථා ඇති කිරීමටත්, විදේශ විනිමය ඉපැයීම ඉහළ නැංවීමටත් හේතු වන තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව නවෝත්පාදන සහ පර්යේෂණ මධ්‍යස්ථානයක් බවට පත්වේ.

03 පරිච්ඡේදය-2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල සීමාව දක්වා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ACA -F

Statement of Financial Performance
for the period ended 31st December 2022

Budget 2022 Rs.		Note	Actual 2,022 Rs.	Actual 2,021 Rs.	
	Revenue Receipts			-	
-	Income Tax	1	-	-	ACA-1
2,050,000,000	Taxes on Domestic Goods & Services	2	16,755,636,726	14,702,641,869	ACA-1
-	Taxes on International Trade	3	-	-	ACA-1
-	Non Tax Revenue & Others	4	1,441,442	465,438	ACA-1
2,050,000,000	**Total Revenue Receipts (A)**		16,757,078,168	14,703,107,307	
	Non Revenue Receipts		-	-	
-	Treasury Imprests		1,870,383,000	3,065,150,000	ACA-3
-	Deposits		10,100	60,620	ACA-4
300,000	Advance Accounts		942,794	149,554	ACA-5
-	Other Main Ledger Receipts		-	-	
300,000	**Total Non Revenue Receipts (B)**		**1,871,335,894**	**3,065,360,174**	
2,050,300,000	**Total Revenue Receipts & Non Revenue Receipts C = (A)+(B)**		**18,628,414,062**	**17,768,467,481**	
	Remittance to the Treasury (D)		-	-	
	Net Revenue Receipts & Non Revenue Receipts E = (C)-(D)		**18,628,414,062**	**17,768,467,481**	
	Less: Expenditure				
	Recurrent Expenditure				
30,500,000	Wages, Salaries & Other Employment Benefits	5	23,087,957	10,860,605	ACA-2(ii)
68,140,000	Other Goods & Services	6	49,950,929	32,367,929	ACA-2(ii)
1,093,200,000	Subsidies, Grants and Transfers	7	934,108,322	973,052,606	ACA-2(ii)
-	Interest Payments	8	-	-	ACA-2(ii)
-	Other Recurrent Expenditure	9	-	-	ACA-2(ii)
1,191,840,000	**Total Recurrent Expenditure (F)**		**1,007,147,208**	**1,016,281,139**	
	Capital Expenditure				
1,400,000	Rehabilitation & Improvement of Capital Assets	10	4,051,813	-	ACA-2(ii)
4,800,000	Acquisition of Capital Assets	11	5,849,020	705,679,440	ACA-2(ii)
1,900,000,000	Capital Transfers	12	1,194,501,042	1,613,453,212	ACA-2(ii)
-	Acquisition of Financial Assets	13	-	-	ACA-2(ii)
200,000	Capacity Building	14	196,820	-	ACA-2(ii)
630,000,000	Other Capital Expenditure	15	215,005,080	332,711,456	ACA-2(ii)
2,536,400,000	**Total Capital Expenditure (G)**		**1,419,603,775**	**2,651,844,108**	
-	Deposit Payments		13,200	32,520	ACA-4
3,500,000	Advance Payments		2,250,435	2,184,455	ACA-5
-	Other Main Ledger Payments		-	-	
3,500,000	**Total Main Ledger Expenditure (H)**		**2,263,635**	**2,216,975**	
3,731,740,000	**Total Expenditure I = (F+G+H)**		2,429,014,618	3,670,342,222	
	Balance as at 31st December J = (E-I)		16,199,399,444	14,098,125,259	
	Balance as per the Imprest Reconciliation Statement		16,199,399,444	14,098,125,259	ACA-7
	Imprest Balance as at 31st December		-	-	ACA-3
			16,199,399,444	14,098,125,259	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ACA-P

Statement of Financial Position
As at 31st December 2022

	Note	Actual 2022 Rs	Restated 2021 Rs
Non Financial Assets			
Property, Plant & Equipment	ACA-6	713,569,740	705,635,240
Financial Assets			
Advance Accounts	ACA-5/5(a)	3,342,542	2,034,901
Cash & Cash Equivalents	ACA-3	-	-
Total Assets		**716,912,282**	**707,670,141**
Net Assets / Equity			
Net Worth to Treasury		3,317,542	2,006,801
Property, Plant & Equipment Reserve		713,569,740	705,635,240
Rent and Work Advance Reserve	ACA-5(b)		
Current Liabilities			
Deposits Accounts	ACA-4	25,000	28,100
Unsettled Imprest Balance	ACA-3	-	-
Total Liabilities		**716,912,282**	**707,670,141**

Detail Accounting Statements in ACA format Nos. 1 to 7 presented in pages from 7 to 29 and Annexures to accounts presented in pages from 30 to 30 form an integral part of these Financial Statements. The Financial Statements have been prepared in complying with the Generally Accepted Accounting Principles whereas most appropriate Accounting Policies are used as disclosed in the Notes to the Financial Statements and hereby certify that figures in these Finacial Statements, Notes to accounts and other relevant accounts were reconciled with the Treasury Books of Accounts and found in agreement.

We hereby certify that an effective internal control system for the financial control exists in the Reporting Entity and carried out periodic reviews to monitor the effectiveness of internal control system for the financial control and accordingly make alterations as required for such systems to be effectively carried out.

Chief Accounting Officer
Name :
Designation : Secretary
Date : Ministry of Technology

Accounting Officer
Name :
Designation : Secretary
Date : Ministry of Technology

Chief Financial Officer/ Chief Accountant/ Director (Finance)/ Commissioner (Finance)
Name :
Date :
K.D. Dilgeea Rathnayake
Cheif Financial Officer
Ministry of Technology

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ACA-C

Statement of Cash Flows
for the Period ended 31st December 2022

	Actual	
	2022	**2021**
	Rs.	**Rs.**
Cash Flows from Operating Activities		**-**
Total Tax Receipts		14,702,641,869
Fees, Fines, Penalties and Licenses	-	-
Profit	-	-
Non Revenue Receipts	1,441,442	465,438
Revenue Collected on behalf of Other Revenue Heads	-	-
Imprest Received	1,870,383,000	3,065,150,000
Recoveries from Advance	754,584	149,554
Deposit Received	10,100	60,620
Total Cash generated from Operations (A)	**1,872,589,126**	**17,768,467,481**
Less - Cash disbursed for:		
Personal Emoluments & Operating Payments	72,940,736	33,635,563
Subsidies & Transfer Payments	644,108,322	674,223,506
Expenditure incurred on behalf of Other Heads	5,349,158	93,500,000
Impresst Settlement to Treasury	-	14,702,641,869
Advance Payments	1,160,889	1,400,371

Deposit Payments	13,200	32,520
Total Cash disbursed for Operations (B)	**723,572,305**	**15,505,433,828**
NET CASH FLOW FROM OPERATING ACTIVITIES(C)=(A)-(B)	**1,149,016,821**	**2,263,033,653**
<u>Cash Flows from Investing Activities</u>		
Interest	-	-
Dividends	-	-
Divestiture Proceeds & Sale of Physical Assets	-	-
Recoveries from On Lending	-	-
Total Cash generated from Investing Activities (D)	**-**	**-**
<u>Less - Cash disbursed for:</u>		
Purchase or Construction of Physical Assets & Acquisition of Other Investment	1,149,200,691	2,263,033,653
Total Cash disbursed for Investing Activities (E)	**1,149,200,691**	**2,263,033,653**
NET CASH FLOW FROM INVESTING ACTIVITIES(F)=(D)-(E)	**(1,149,200,691)**	**(2,263,033,653)**
NET CASH FLOWS FROM OPERATING & INVESTMENT ACTIVITIES (G)=(C) + (F)	**0**	**0**
<u>Cash Flows from Financing Activities</u>		
Local Borrowings	-	-
Foreign Borrowings	-	-
Grants Received	-	-
Total Cash generated from Financing Activities (H)	**-**	**-**
<u>Less - Cash disbursed for:</u>		
Repayment of Local Borrowings	-	-
Repayment of Foreign Borrowings	-	-

Total Cash disbursed for Financing Activities (I)	**-**	**-**
NET CASH FLOW FROM FINANCING ACTIVITIES (J)=(H)-(I)	**-**	**-**
Net Movement in Cash (K) = (G) + (J)	**0**	**0**
Opening Cash Balance as at 01st January	**0**	**0**
Closing Cash Balance as at 31st December	**0**	**0**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන

වාර්තා කිරීමේ පදනම	
1)	වාර්තාකරණ කාල පරිච්ඡේදය
	මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වේ.
2)	මිනුම්කරණ පදනම
	සමහර වත්කම් නැවත තක්සේරු කිරීමෙන් වෙනස් කරන ලද ඓතිහාසික පිරිවැය මත මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත. වෙසෙසින් දක්වා නොමැති විට, වෙනස් කරන ලද මුදල් පදනමක් මත ගණනය කිරීම් සිදු කර ඇත.
	මූල්‍ය ප්‍රකාශයන්හි සඳහන් සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර ඇත.
3)	ආදායම් හඳුනා ගැනීම
	අදාළ ආදායම් කාලසීමාව නොසලකා ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළදී මුදල් ලැබීම් මත, හුවමාරු හා හුවමාරු නොවන ආදායම් හඳුනා ගනු ලැබේ.
4)	දේපළ, පිරියත හා උපකරණ (PP&E) හඳුනා ගැනීම හා මැනීම
	වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා එන බවට තහවුරුවක් ඇතිවිට හා එම වත්කම්වල වටිනාකම විශ්වසනීයව මැනිය හැකි නම්, එය දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ලෙස හඳුනා ගනු ලැබේ.
	පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී, නැවත තක්සේරු කරනු ලබන ආකෘතිය අදාළ කර ගනිමින් දේපළ, පිරියත හා උපකරණ පිරිවැයක් ලෙස මනිනු ලැබේ.
5)	දේපළ, පිරියත හා උපකරණ සංචිතය
	මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවලට අනුරූප ගිණුම වේ.
6)	මුදල් හා මුදල්වලට සමාන දෑ
	2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින්, මුදල් හා මුදල් හා සමාන දෑ සමන්විත වේ.

ඒසීඒ - 1(ii)

3.5 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි : තාක්ෂණ අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය : 186

රු.

ආදායම් සංකේතය	විස්තරය	මූලික ආදායම් ඇස්තමේන්තුව	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව	මූලික ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස විචලතාව	විචලතාවට හේතු
1002.11.00	විදුලි සංදේශන බද්ද	18,000,000,000	-	-	-
1002.14.00	ජංගමදුරකථන සන්නිවේදන කුළුණු බද්ද	1,500,000,000	-	-	-
1002.15.00	කෙටි වෙළඳ පණිවිඩ බද්ද	550,000,000	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදනය			ප්‍රතිපාදන වෙන් කිරීමේ උපයෝජනය අවසාන ප්‍රතිපාදනය වෙන් කිරීමේ % ක් ලෙස
	මුල්	අවසාන	සත්‍ය වියදම	
පුනරාවර්තන	1,006,315,000	1,089,190,440	1,016,281,139.44	93%
ප්‍රාග්ධන	8,371,890,000	8,371,890,000	2,651,844107.95	32%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව මෙම අමාත්‍යාංශය වෙත වියදම් කිරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම්

රු. 000

අනු අංකය අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනය වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන වෙන් කිරීම		සත්‍ය වියදම	ප්‍රතිපාදන වෙන් කිරීම උපයෝජනය අවසන් ප්‍රතිපාදන වෙන් කිරීමේ % ක් ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
	නැත.					

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තාකරණයේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	ගිණුම්කරණයට නියමිතව පවතින	ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්	56,352,400.00	56,635,240.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	සිදු කෙරෙමින් පවත්නා වැඩ				
9180	බදු දෙන ලද වත්කම්		700,000,000.00		100%

3.9 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඑම්ටී/සී/එම්ඕටී/එෆ්ඒ/2022 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

ලේකම්,
තාක්ෂණ අමාත්‍යාංශය

ශීර්ෂය - 186, තාක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 186, තාක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයක් වන ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගමේ (SLINTEC) ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් ඉකුත් වර්ෂ වල වැය කර තිබූ රු.700,000,000 ක් අමාත්‍යාංශයේ වත්කම ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එකතුව රු.713,569,740 වන දේපල පිරියත හා උපකරණ වටිනාකම තුල දක්වා තිබුණි.

(ආ) අංක 186-2-03-009-2509 වැය විෂය යටතේ සමාලෝචිත වර්ෂයේ රු.5,190,000 කට මිලට ගෙන තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර විස්සක (20) වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ යටතේ ඇතුලත් කර නොතිබුණි.

1.6.2 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

වන් ගෝල්ෆේස් කුළුණෙහි එකොළොස්වන මහලේ අමාත්‍යාංශය පවත්වාගෙන යාම වෙනුවෙන් ඇතිකරගත් බදුකුලී ගිවිසුමට අනුව මූලික තැන්පතු මුදල ලෙස රු.4,206,720 ක් ගෙවා තිබුණි. 2016 අගෝස්තු මස 03 වන දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 250/2016(i) අනුව රජයේ කාර්යාල ගොඩනැගිලි කුලී සඳහා අත්තිකාරම් ගෙවීම ජනරජ ගිණුමේ හෙළිදරව් කිරීමේ අරමුණින් එක් එක් අත්තිකාරම් වෙනුවෙන් 9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම සහ 9189 - කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම යන ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ සටහන් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වුවත් ඒ අනුව නිසි පරිදි කටයුතු නොකිරීම හෝ වියදම් කළමනාකරණයේ අඩුපාඩු නිසා වැය විෂයන් හතක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.2,150,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබූ අතර වැය විෂයයන් දෙකක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.1,400,000 ක් වූ ප්‍රතිපාදන වලින් රු.950,000 ක් වෙනත් වැය විෂයයන් වලට මාරුකිරීමෙන් අනතුරුව ඉතිරි වූ රු.450,000 ක ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි.

2 .2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂයට අදාලව බැදීම් හා බැරකම් හඳුනාගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් එම චක්‍රලේඛය ප්‍රකාරව රු.183,248 ක් වටිනා බැදීම් හා බැරකම් හඳුනාගෙන 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල බැදීම් හා බැරකම් යටතේ ඇතුලත්කර නොතිබුණද 2023 පළමු කාර්තුවේදී මෙම බැදීම් හා බැරකම් වලට ගෙවීම් කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනයේ රු.මිලියන 40 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත වියදම රු.මිලියන 26.52 ක් දරා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් (ICT Solution for Gov Analyst Dept- GAD) ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වලින් සියයට 75ක් පමණ නිමකල පසු එලෙස නිර්මාණය කරන ලද පද්ධතියේ අයිතමයන් හා ආයතනයේ අවශ්‍යතා අතර වෙනස්කම් පැවති බවට අනාවරණය වීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතරමග අත්හිටුවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය යටතේ ක්‍රියාත්මක වන Lanka Government Network 2.0 ව්‍යාපෘතිය විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර රු.මිලියන 12,737.29 ඇස්තමේන්තු කර 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5,839.26 ක මුදලක් වැය කර තිබුණි. 2022 නොවැම්බර් මස අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදුකරන ලද නිරීක්ෂණ ප්‍රකාරව නව ආයතන 140ක් ජාලගත කිරීම මෙතෙක් සිදුකර නොතිබුණු අතර ජාලගත කරන ලද ආයතන 860න් ඇතැම් ආයතන එය පසෙකලා පෞද්ගලිකව ආයතන මඟින් එම පහසුකම් ලබා ගැනීමට යොමුවීම් තිබෙන බවට අනාවරණය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය යටතේ ව්‍යාපෘති 09 ක් සඳහා රු.මිලියන 1,460.99 ක ඇස්තමේන්තුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘති 09 වෙනුවෙන් රු.මිලියන 274.07 ක් වැය කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 03 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණ ද ඉන් කිසිදු ව්‍යාපෘතියක් එදිනට නිමකර නොතිබුණි. ඉතිරි ව්‍යාපෘති වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත්, ඉතිරිව ඇති කාලයේදී නිම කිරීමට ක්‍රමවත් සැලසුමක් ඉදිරිපත් කර නොතිබුණ අතර අමාත්‍යාංශයේ ප්‍රමාණවත් අධීක්ෂණයක් ඒ සඳහා යොමුවී නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) තාක්ෂණ අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා වර්ග අඩි 7,512 ක ඉඩ ප්‍රමාණයක් මාසිකව රු.1,878,000 ක් ගෙවීමේ පදනම මත 2021 ජුනි මස 22 වන දින අවුරුදු 05 ක බදුකුලී ගිවිසුමකට පෞද්ගලික සමාගමක් සමඟ ඇති කර ගෙන තිබුණි. ඉන් වර්ග අඩි 2,217 ක් ඌන උපයෝජිතව පවතින නිසා 2022 ජුලි මස 12 වන දින අදාල ආයතනයට ආපසු භාරදී තිබුණි. එම කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද රු.6,651,000ක මුදල නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ආ) අරමුණු 09ක් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය (Centre of Excellence in Robotic Applications) පිහිටුවීම සඳහා එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු.189,909,295 වැයකර ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලදී ගැනීම් සිදුකර තිබුණද එම අරමුණු 09 ඉටුකරගෙන නොතිබුණි.

(ඇ) රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා වර්ග අඩි 3000 ක පමණ ශ්‍රවණාගාර දෙකක් වායුසමීකරන යන්ත්‍ර 10ක් සවිකර කාපට් අතුරා බිම් සැලසුම් (foor plan) සකස් කර තිබුණි. මේ සඳහා 2018 වර්ෂයේදී මිලියන 40 වැය කර ස්ථාපිත කරනු ලැබූ Robert Arm යන්ත්‍ර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියට අදාල උපකරන හා යන්ත්‍ර භාවිතා කරන බවට නිරීක්ෂනය විය.

3.3 කළමනාකරණ දුර්වලතා

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් යටතේ දේශීය භාණ්ඩ හා සේවා මත බදු ලෙස රු.16,755,636,726 ක් දක්වා ඇත්තේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එකතුකොට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද භාණ්ඩාගාරය විසින් සිගැස් (CIGAS) වැඩසටහන වෙත ඇතුලත් කරන ලද වටිනාකම වන අතර එම ආදායමේ නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් සිගැස් (CIGAS) වැඩසටහනට ඇතුලත් කල වටිනාකම සහිත ලේඛනය හැර අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබූ අතර එම විස්තර අදාල ආයතනයෙන් ලබා ගැනීම සහ නියාමනය සඳහා අමාත්‍යාංශය හා එම ආයතනය අතර නිසි ක්‍රමවේදයක් ද නිර්මාණය වී නොමැති බව නිරීක්ෂණය විය.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

තාක්ෂණ අමාත්‍යාංශය
தொழில்நுட்ப அமைச்சு
MINISTRY OF TECHNOLOGY
1106-1108, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1ඒ, මැද පාර, කොළඹ 02
1106-1108, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A, சென்டர் வீதி, கொழும்பு 02
Unit 1106-1108, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02
/motechsrilanka
/mot_srilanka
mot.gov.lk

මගේ අංකය / எனது இல / My No. MOT/FIN/DO 02/11	ඔබේ අංකය / உமது இல / Your No.	දිනය / திகதி / Date 2023.12. 22

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
බත්තරමුල්ල.

ශීර්ෂය 186- තාක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.

ශීර්ෂය 186- තාක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ඔබගේ 2023.10.09 දිනැති අංක අයිඑම්ටී /සී /එම්ඕටී /එම්ආර් /2022 දරන විගණන විමසුම මගින් ඉල්ලා සිටින ලද තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(i). නැනෝ තාක්ෂණ ආයතනයේ වත්කම් තාක්ෂණ අමාත්‍යාංශයේ පරිගණක ගිණුම් පද්ධතියෙන් අපහරණය කොට අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා දීමට කටයුතුකර තිබේ.

(ii). 2023 මාර්තු මස CIGAS වැඩසටහන මගින් ඔබ විසින් පෙන්වා දී ඇති ලැප්ටොප් පරිගණක 20 දේපල පිරියත උපකරණ යටතේ අමාත්‍යාංශයේ වත්කම් ලෙස ඇතුලත් කර තිබේ.

(ආ) තාක්ෂණ අමාත්‍යාංශ කාර්යාලය පවත්වාගෙන යාමේ ගොඩනැගිල්ලේ කුලී අත්තිකාරම්, කුලි හා වැඩ අත්තිකාරම් ගිණුම සහ කුළි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම යන ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ සටහන් කිරීමට කටයුතු කරන ලදි.

2. මූල්‍ය සමාලෝචනය
2.1 වියදම් කළමනාකරණය
ඇස්තමේන්තු නිසි පරිදි සකස් කිරීමට සටහන් කර ගනිමි.

2.2 2023 වර්ෂය සඳහා බැරකම් ලේඛනයක් නිසි පරිදි පවත්වාගෙනයාමට අවශ්‍ය පියවර ගෙන තිබේ. ඒ අනුව බැදීම් හා බැරකම් අවසාන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගනිමි.

3. මෙහෙයුම් සමාලෝචනය
3.1 කාර්යයභාරයන් ඉටු නොකිරීම

(අ). ව්‍යාපෘති තෝරා ගැනීමේදි ශක්‍යතා අධ්‍යයනයක් හා අවශ්‍යතාවය නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුන් අතර ඒ සඳහා අමාත්‍යාංශය මගින් නිසි අධීක්ෂණයන් කිරීමට නිලධාරින් පත් කර තිබේ.

දුරකථන / தொலைபேசி / Telephones +94112334691 +94112334575
ෆැක්ස් / பெக்ஸ் / Fax +94112334576
ඉ-තැපැල / மின் அஞ்சல் / E-mail info@mot.gov.lk

(ආ) ඔබගේ නිර්දේශ අනුව ඉදිරියේදි ශක්‍යතා අධ්‍යයනයන් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක ආයතන වලින් feed back ලබා ගැනීම,ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම, කාර්යය සාධන වාර්තා ලබාගැනීමටත්, ඇගයීමට හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමටත් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් අමාත්‍යාංශය මගින් අධීක්ෂණ කටයුතු කිරීමටත් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ)ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ කාර්ය සාධනය කාර්තුමය වශයෙන් ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. ව්‍යාපෘතීන් වල නිම කිරීමේ කාලය පිළිබඳව හා වර්ෂයේ සැලසුමට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් සමාලෝචනය කිරීමට පියවර ගෙන තිබේ.

(ඇ) ඉහත සදහන් පරිදි අමාත්‍යාංශය යටතේ ඇති රජයේ මුදල් වැය කරනු ලබන ආයතන පිළිබඳ නිසි පරිදි අධීක්ෂණය කර කාර්යභාරය නිසි පරිදි ඉටු කරන බවට ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වා තහවුරු කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් සකස් කිරීමට පියවර ගනිමි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ කුලිය වර්තමානයේ පවතින අනිකුත් ගොඩනැගිලි කුලියට සමාන වන අතර ආරක්ෂක පහසුකම් නොමිලේ ලබා ගැනීමටත් අවස්තාව හිමි වී තිබේ.ඒ අනුව තවදුරටත් අවම පිරිවැයක් තුල මෙම කටයුතු සිදුකිරීමට සටහන් කර ගනිමි.

(ආ) මෙම උපකරණ යොදා ගනිමින් ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීම සදහා අවශ්‍ය සම්පත් අමාත්‍යාංශය වෙත නිසි පරිදි පවරාගැනීමට පුළුල් ලෙස කටයුතු කල යුතු බැවින් ඒ සදහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගනිමි.

(ඇ) ROBOT ARM යන්ත්‍ර උපකරණ ඉදිරියේදි විධිමත්ව ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

(ඇ) CERA ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ පූර්ණ පරීක්ෂාවක් සිදු කිරීමට සටහන් කරගෙන තිබේ.

3.3 කළමනාකරණ දූර්වලතා
(අ) මූල්‍ය ප්‍රකාශනයේ සදහන් කරන ආදායම පිළිබඳ විස්තර අදාල ආයතනයෙන් ලබා ගෙන එම කටයුතු නිසි පරිදි නියාමනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

[signature]

මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන
ලේකම්

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	බලාපොරොත්තු වූ ප්‍රතිපලයට සාපේක්ෂව සත්‍ය ප්‍රතිපල ප්‍රතිශතය (%)		
	100% - 90%	75% - 89%	50% -74%
පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද දත්ත ආරක්ෂණ පනත	√	-	-
අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය	√	-	-

අමාත්‍යාංශය සතු වන්නේ ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘතිය (SLUDI) පමණි.

ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘතිය (SLUDI) අමාත්‍යාංශයේ පාලනය යටතේ පවතින අතර පළමු ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම 2022 වසරේ තුන් වන කාර්තුවේදී නිකුත් කිරීම සඳහා නිර්මාණය කර, සැළසුම් කර ඇත. මේ සඳහා වෙනමම ව්‍යාපෘති කාර්යාලයයක් බත්තරමුල්ලේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටුවා ඇත. ඉහත විස්තර කරන ලද පරිදි, එම ජෛවමිතික සහිත ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත නිකුත් වීමත් සමගම පුද්ගලයන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් පවතින අපැහැදිලිතා සහ නොගැලපීම් පිළිබඳ ගැටළු විසඳෙනු ඇති අතර එය ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල හා පුළුල්, නිල වශයෙන් පිළිගැනීමක් සහිත පුද්ගල හඳුනා ගැනීමේ හා තහවුරු කර ගැනීමේ මාධ්‍යය බවට පත්වනු ඇත.

ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘති කාර්යාලය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය තාක්ෂණ අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ එක්ව වැඩ කටයුතු සිදු කරනු ඇත. අමාත්‍යාංශ ලේකම් විසින් මෙම ව්‍යාපෘතියේ කාර්ය සාධනය කලින් කලට අධීක්ෂණය කරනු ලබන අතර එහි සැලසුම්ගත පරිදි අවශ්‍ය සුමට ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය මග පෙන්වීම් හා නිවැරදි කිරීම්ද සිදු කරනු ලැබේ.

- ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහාත්, ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සඳහාත් ශ්‍රී ලංකා රජයේත්, ඉන්දියානු රජයේත් නියෝජිතයින් සමගින් සැදුම්ලත් ඒකාබද්ධ ව්‍යාපෘති කළමනාකරණ කමිටුවක් පත් කරන ලදි.

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයුම් කමිටුව පත් කරන ලදි. - ශ්‍රී ලාංකීය අනන්‍ය ඩිජිටල් හැඳුනුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, සහායවීම සහ නඩත්තු කිරීම සඳහා ප්‍රධාන පද්ධති ඒකාබද්ධකරු ප්‍රසම්පාදනය කිරීම.

- හඳුනා ගැනීම් පද්ධති ඒකාබද්ධකරු බඳවා ගැනිමට ඉල්ලුම් කිරීම සඳහා යෝජනාව සකස් කරමින් පවතී.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්කය	සාර්ථකත්වයේ දර්ශක	ජයග්‍රහණයේ ප්‍රගතිය		
			0% - 49%	50%-74%	75% - 100%
4 වැනි අරමුණ - සියළු දෙනාම සඳහා අන්තර්ගත සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලයටම ඉගෙන ගැනීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම	4.4 2030 වසර වනවිට තාක්ෂණික සහ වෘත්තීමය හැකියාවන්, රැකියා සඳහා, සභ්‍ය රැකියා සහ ව්‍යවසායකත්වයන් ඇතුළුව අදාළ හැකියාවන් සහිත තරුණ තරුණියන් සහ වැඩිහිටියන් සංඛ්‍යාව ප්‍රමාණවත් පරිදි ඉහළ නැංවීම	4.4.1. තොරතුරු හා තාක්ෂණ (ICT) කුසලතා ඇති තරුණ හා වැඩිහිටියන්ගේ අනුපාතය	-	√	-
9 වැනි අරමුණ. සවිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.	9.5 2030 වර්ෂය වනවිට සියළු රටවල විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල විද්‍යාත්මක පර්යේෂණ වැඩි කිරීම, කාර්මික අංශයන්ගේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම, නවෝත්පාදනය උනන්දු කිරීම සහ මිලියන එකක් බැගින් වූ ජනතාවකට පර්යේෂණ සහ සංවර්ධන සේවකයන්ගේ සංඛ්‍යාව හා රාජ්‍ය සහ පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධනය සඳහා මුදල් වියදම් කිරීම	9.ඕ.1 ජංගම දුරකථනයකින් සහ තාක්ෂණයෙන් ආවරණය වන ජනගහන අනුපාතය	-	√	-

	ප්‍රමාණවත් පරිදි වැඩි කිරීම. 2030 .ඇ 9වසර වනවිට තොරතුරු සහ සන්නිවේදනය තාක්ෂණය සඳහා ප්‍රවේශය ප්‍රමාණවත් පරිදි වැඩි කිරීම සහ අවම වශයෙන් දියුණු වී ඇති රටවල් සඳහා අන්තර්ජාල ප්‍රවේශය විශ්වීයව හා දැරිය හැකි මිලකට ලබා දීමට උත්සාහ ගැනීම.				
17 වැනි අරමුණ. තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කිරීමේ ආකාරයන් සවිමත් කිරීම හා පුනර්ජීවනය.	විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදනය සඳහා උතුරු - දකුණු, දකුණු - දකුණු සහ ත්‍රිකෝණාකාර කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ පවතින යාන්ත්‍රණයන් අතර වැඩිදියුණු කරන ලද සම්බන්ධීකරණය මගින් අනොන්‍ය වශයෙන් එකඟ වන කොන්දේසි මත විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ මට්ටමින් සහ ගෝලීය තාක්ෂණික පහසුකම් යාන්ත්‍රණයක් හරහා දැනුම බෙදා ගැනීම වැඩි දියුණු කිරීම.	17.6.1 නිවැසියන් 100 කට ස්ථාවර අන්තර්ජාල බ්‍රෝඩ්බෑන්ඩ් දායකත්වය	-	√	-

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන විසින් ඉහත සඳහන් තිරසාර සංවර්ධන අරමුණු උපරිමයෙන් සාක්ෂාත් කරගැනීම සඳහා හැකි අයුරින් කටයුතු කරනු ලැබේ. පවත්නා දේශපාලන අස්ථාවරත්වය හා සම්බන්ධ ගැටළු හා නිසි කලට සම්පත් වෙන් කර ගැනීමට හැකිවීම වැනි අපහසුතා මධ්‍යයයේ වුවද, තිරසාර සංවර්ධන අරමුණුවලින් අපේක්ෂිත ප්‍රතිපල ළඟා කර ගැනිමේදී සතුටුදායක මට්ටමක් ළඟා කර ගැනීමට හැකි වී ඇත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

I. උපත් ලියාපදිංචිය ඇතුළුව සියළු දෙනාටම නෛතික අනන්‍යතාවක් ලබා දීම සිදු කෙරෙමින් පවතී.

II. ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය (e-NIC) - සියලුම ශ්‍රී ලාංකික පුරවැසියනට තම අනන්‍යතාවය ඉතාමත් නිවැරදිව හා ඉතා කාර්යක්ෂම ලෙස තහවුරු කළ හැකි වන පරිදි ශ්‍රී ලාංකීය ඒකීය ඩිජිටල් හැඳුනුම්පත (Sri Lanka Unique Digital Identity) නිකුත් කිරීම.

III. දත්ත ආරක්ෂණ පනත පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදී.

IV. දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය 22 අගෝස්තු 2022 අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී .

අභියෝග

I. දේශපාලන අස්ථාවරත්වය.

II. මූලාශ්‍ර ප්‍රභවයන්ගේ පිහිටීම සොයා ගැනීමේදී පවතින දුෂ්කරතාවන්

III. නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කර ඇති බැවින් පුහුණු හා පළපුරුදු කාර්යය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් අවශ්‍ය මිනිස් බලය නැති වීම හේතුවෙන් අමාත්‍යාංශයේ කටයුතු විධිමත්ව හා නිසි ආකාරයෙන් සිදු කිරීමට නොහැකි වී ඇත.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	13	09	04
තෘතීයික	01	-	01
ද්විතියික	30	17	13
ප්‍රාථමික	16	02	14
වෙනත්	01	01	-

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

අමාත්‍යාංශය වෙත ප්‍රශස්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවක් ලබා දෙන ලෙස අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීම් කිහිපයක් කර ඇතත්, තවමත් එවැනි අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලයක් ස්ථානගත කර නැත. පළපුරුදු සහ පුහුණු කාර්ය මණ්ඩලයක හිඟයත්, සම්පත් හිඟයත් අමාත්‍යාංශයේ කාර්ය සාධනය කෙරෙහි නිසැකවම බලපා ඇත. ක්‍රියාකාරී සැලසුම් සහ ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය සඳහා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් නැත. සංවර්ධනයට අදාළ බොහෝ කාර්යයන් සිදු කරනු ලබන්නේ නව පත්වීම් ලාභී සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු විසිනි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු. '000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
කොවිඩ් වසංගතය හා රටේ ආර්ථික අර්බුධය හේතුවෙන් පුහුණු වැඩසටහන් සීමාකර ඇත.						

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**	-	-	-
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අමාත්‍යාංශය සඳහා අදාළ නොවේ.	අමාත්‍යාංශය සඳහා අදාළ නොවේ.
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අමාත්‍යාංශය සඳහා අදාළ නොවේ.	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අමාත්‍යාංශය සඳහා අදාළ නොවේ.	-
1.6	වෙනත්	අනුකූල නොවේ	අමාත්‍යාංශය සඳහා අදාළ නොවේ.	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**		-	-
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**		-	-
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-

4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මුදල් රෙගුලාසි 134(2) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තෙමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	කළමනාකරණ විගණන දෙපාර්තෙමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ පිළිබඳව චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ කටයුතු සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.		-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.		අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	-
9.3	වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම		-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.		-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.		අමාත්‍යාංශය සඳහා සංචිත වාහන නැත.	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.		-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ සක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	-	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බබන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ	කල් ඉකුත් වූ තැන්පත් නැත.	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිතුක් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිතුක් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අනුකූල නොවේ	ආදායම් ගිණුමක් නැත.	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම.	අනුකූල නොවේ	ආදායම් ගිණුමක් නැත.	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	ආදායම් ගිණුමක් නැත.	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල නොවේ	සීමිත සේවක සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් නිශ්චිත ඇගයුමක් සිදු කිරීමට අපහසුය.	රාජකාරී ලැයිස්තු සකස් කරමින් පවතී.
16.3	20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	තොරතුරු නිලධාරියකු පත් කර නොතිබූ අතර ඉල්ලීමක් කර නොතිබිණි.	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	කුඩා කාර්යය මණ්ඩලයක් පමණක් ඇත.	තොරතුරු නිලධාරියකු මෙම වසරේදී පත් කරනු ඇත.
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා ඇත	අනුකූල නොවේ	-	මෙම වර්ෂයේදී මහජන ප්‍රතිචාර එක් කිරීමට හැකි වන අයුරින් වෙබ් අඩවිය සකස් කරමින් පවතී.
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	තොරතුරු නිලධාරියකු පත් කර නොතිබූ අතර ඉල්ලීමක් කර නොතිබිණි	-
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	කුඩා කාර්යය මණ්ඩලයක් පමණක් ඇත.	තොරතුරු නිලධාරියකු මෙම වසරේදී පත් කරනු ඇත.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	කුඩා කාර්යය මණ්ඩලයක් පමණක් ඇත.	තොරතුරු නිලධාරියකු මෙම වසරේදී පත් කරනු ඇත.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 හි සඳහන් ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	කුඩා කාර්යය මණ්ඩලයක් පමණක් ඇත.	තොරතුරු නිලධාරියකු මෙම වසරේදී පත් කරනු ඇත.

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘති පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම.	අනුකූල නොවේ	කුඩා කාර්යය මණ්ඩලයක් පමණක් ඇත.	තොරතුරු නිලධාරියකු මෙම වසරේදී පත් කරනු ඇත.
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් තළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-

8. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

8.1 ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ අනාගත සැලසුම්

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය	ව්‍යාපෘති කාලසීමාව	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) (රු. මිලියන)	සමුච්චිත වියදම්. (රු. මිලියන)	භෞතික ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය
1	ලංකා රාජ්‍ය ජාලය 2.0	රාජ්‍ය ආයතන තනි ඩිජිටල් යටිතල ව්‍යූහයක හා සම්බන්ධ කිරීම සඳහා කේන්ද්‍රීයව කළමනාකරණය වන රාජ්‍ය ජාලයක් ක්‍රියාත්මක කිරීම.	2016 - 2022	12,737.29	5,007.42	90%	රාජ්‍ය ආයතන 860ක් ලංකා රාජ්‍ය ජාලය (LGN 2.0 හා සම්බන්ධ වී ඇත. සමස්ථ අඩවි 860 වම LGN මූලික ජාල ක්‍රියාකාරීත්වයන් සමඟ අන්තර්ජාල සහ දත්ත සන්නිවේදනය සඳහා Wi Fi ප්‍රවේශය ලබා දී ඇත.
2	ලංකා රාජ්‍ය මේඝය (Lanka Government Cloud) 2.0, 2 වැනි අදියර (Middle-ware සහ යෙදුම් සමඟින් වැඩි දියුණු කිරීම)	වැඩි දියුණු කළ මේඝ යටිතල පහසුකම් ස්ථාපිත කිරීමෙන් රජය හරහා සන්නිවේදනය වැඩි දියුණු කිරීම.	2017 - 2023	2,449.50	367.93	70%	1) Bare-metal සර්වර්වල වගකීම් කාල සීමාව දීර්ඝ කිරීමක් සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. 2) මාස 12ක් සඳහා ලංකා රාජ්‍ය මේඝය 2.0 හි open stack Based Cloud සඳහා සහාය සහ නඩත්තුව සැපයීම - කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී.

3	තාක්ෂණ විසරණ වැඩසටහන	නව තාක්‍ෂණයන් සංවර්ධනය කිරීම, දැනට පවතින හා නව තාක්‍ෂණයන් දේශීය සහ ගෝලීය ව්‍යාපාර වෙත විසරණය කිරීම සහ තාක්‍ෂණයන් ඵලදායී ලෙස යොදා ගනිමින් ව්‍යාපාර පරිවර්තනය කිරීම මගින් ආදායම සහ රැකියා සංඛ්‍යාව ඉහළ නැංවීම.	2021 – 2024	1,300.00	0.04	20%	හිතකර පදනමක් යටතේ ජාතික නවෝත්පාදන සහ තාක්ෂණ වේදිකාවේ (NTIP) 01 වැනි අදියර සංවර්ධනය කිරීම සඳහා Orange IT එකඟ විය. - පද්ධති අවශ්‍යතා පිරිවිතර සම්පූර්ණ කර Orange IT සමඟ හුවමාරු කර ගන්නා ලදී.
4	ධාරිතා ගොඩනැගීමේ සංරචකය 1	ඩිජිටල් තාක්ෂණයන් භාවිත කිරීම උදෙසා පුරවැසියන් සවිබල ගැන්වීම	2021 - 2024	1,055.00	1.75	16%	D4E (සැමට ඩිජිටල්) වැඩසටහන යටතේ යෙදුම් (Apps) 12ක් පිටසන් කිරීමට නියමිතව ඇත. තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ නිරත කරවීම සඳහා තරුණයින් වෙනුවෙන් භෞතික ඇරඹුම් කඳවුරු 2ක් සහ අතථ්‍ය ඇරඹුම් කඳවුරු 01ක් සාර්ථකව පවත්වන ලදි. සුහුරුලිය දිස්ත්‍රික් සංසදය අම්පාරේදී සාර්ථකව නිම කරන ලදි.
	ධාරිතා ගොඩනැගීමේ සංරචකය 2	අනාගතයෙදි සැනින් රැකියාවල යොදා ගත හැකි ශ්‍රම බලකායක් සැකසීම					ඉන්දියාවේ ජාතික ඩිජිටල් අධ්‍යාපන ප්‍රතිපත්තිය මහජන අදහස් ලබා ගැනීම සඳහා පරිවර්තනය කර බෙදා හරින ලදි. තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ යුනිසෙෆ් සංවිධානය, අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව විස්තීර්ණ, මාර්ගගත පුහුණු

							මොඩියුලයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රවීණ හවුල්කරුවෙකු කුලියට ගන්නා ලදි. එක්සත් ජනපදය පදනම් කරගත් විවෘත මාර්ගගත පාඨමාලා සැපයුම්කරු වන "Coursera" පාඨමාලා අන්තර්ගත සැපයුම්කරු ලෙස හවුල් විය.
	ධාරිතා ගොඩනැගීම: සංරචකය 3	රජයේ සේවකයින්ගේ හැකියාවන් සහ ඩිජිටල් නිපුණතා වැඩි දියුණු කිරීම					Digital Government Maturity Model සම්පූර්ණ කර දියත් කරන ලදි. රජයේ ප්‍රධාන ඩිජිටල් නවෝත්පාදන නිලධාරී මුලපිරුම (Chief Digital Innovation Officer (CDIO)) දියත් කර විභව්‍ය ප්‍රධාන ඩිජිටල් නවෝත්පාදන නිලධාරීන් 50ක් හඳුනා ගන්නා ලදි. රාජ්‍ය නිලධාරීන් 1000ක් සඳහා ඩිජිටල් ආණ්ඩුකරණ සක්‍රීය කිරීමේ සංසද 5ක් පවත්වා ඊළඟ පරම්පරාවේ රාජ්‍ය විභව්‍ය නිලධාරීන් 250ක් හඳුනා ගන්නා ලදි.

5	ඒකීය ඩිජිටල් හැඳනුම්පත (SL-UDI)	අනුපිටපත් සහ ව්‍යාජ අනන්‍යතා ඉවත් කරනු ලබන, පුද්ගලයන්ගේ ජෛවමිතික දත්ත මත පදනම් කර ගත් අනන්‍ය හඳුනාගැනීමේ අංකයක් (UID) නිකුත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සවිබල ගැන්වීම.	2021 - 2024	6,635.00	18.75	16%	ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම ව්‍යාපෘතියේ නිෂ්පාදන මාර්ග දර්ශකය සම්පූර්ණ කර අභ්‍යන්තරව දියත් කරන ලදි. ජෛවමිතික සහ සත්‍යාපන උපාංග මිලදී ගැනීම සහ සුදුසු මෘදුකාංග සඳහා බලපත්‍ර සම්පූර්ණ කර ඇත. ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුමේ මාර්ග දර්ශකය සඳහා ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කර ඇත.
6	රජයේ ගෙවීම් සේවා පද්ධතිය (PAY.GOV.LK)	සපයනු ලබන සේවාවන්ට අදාළව ආදායම් එකතු කිරීම උදෙසා රාජ්‍ය ආයතන සඳහා ඩිජිටල් පද්ධතියක් ස්ථාපිත කිරීම හරහා රජයේ සේවාවන් සඳහා ගෙවීම් කිරීමේදී පුරවැසියන්ට විනිවිදභාවය, ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ පහසුව වැඩි දියුණු කිරීම. දත්ත පදනම් කර ගත් ක්‍රියාවලීන් මත පදනම්ව ගෙවිය යුතු මුදල් නියමිත වේලාවට අයකර ගැනීම සඳහා එම පද්ධතියෙන් පහසුකම් සැපයෙන අතර ණයවර කාඩ්පත්, හර කාඩ්පත්, ජංගම යෙදුම් වැනි විවිධ මූල්‍ය උපකරණ භාවිතයෙන් පුරවැසියන්ට රජය වෙත කළ යුතු ගෙවීම් කිරීමට හැකි වනු ඇත.	2021 - 2022	127.00		10%	Pay.Gov.Lk මූලික පද්ධතියේ අවශ්‍යතා හඳුනා ගන්නා ලද අතර පද්ධතියේ පිරිවැය ඇස්තමේන්තුව සහ පද්ධතියේ අංග ලැයිස්තුව සකසා අවසන් කරන ලදි. ToR අවසන් කර දැනටමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

7	රාජ්‍ය වෙබ් අඩවි සංවර්ධන පද්ධතිය _ (gov.lk වෙබ් අඩවි සංවර්ධන පද්ධතිය)	රාජ්‍ය ආයතන සඳහා පොදු වෙබ් සංවර්ධන පද්ධතියක් නිර්මාණය කිරීම මගින් රජයේ වෙබ් අඩවි නිර්මාණය කිරීමේ කාර්යක්ෂමතාව, සඵලතාව සහ පහසුව වැඩි දියුණු කිරීම.	2021 - 2023	100.00		10%	gov.lk පද්ධතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කරන ලදි. පිරිවැය ඇස්තමේන්තු කර අවසන් කරන ලදි.
8	තෝරාගත් රජයේ රෝහල්වල පින්තූර සංරක්ෂණය සහ සන්නිවේදන පද්ධතිය (PACS) ක්‍රියාත්මක කිරීම	වෛද්‍ය විද්‍යාත්මක රූප (DICOM රූප) ගබඩා කිරීම, ලබා ගැනීම, කළමනාකරණය කිරීම, බෙදා හැරීම සහ ඉදිරිපත් කිරීමේ කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩි දියුණු කිරීම	2021 - 2022	294.30			ආරම්භ නොකරන ලදි.
9	සේවක භාරකාර අරමුදල් කළමනාකරණ (ETF) පද්ධතිය	මධ්‍යගත විසඳුමක් ක්‍රියාත්මක කිරීම මගින් සේවක භාරකාර අරමුදල් කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩි දියුණු කිරීම. (පාර්ශ්වකාර සංවිධානයන් වෙත කාර්යක්ෂම සේවාවන් සැපයීම සඳහා සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ (ETFB) අරමුදල් කළමනාකරණ පද්ධතිය හා සම්බන්ධ සේවාවන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුමක් නිර්මාණය කිරීම)	2016 - 2023	100.00	73.00	93%	සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ මූලික කාර්යයන්හි විස්තීර්ණ ව්‍යාපාරික ක්‍රියාවලියක් ප්‍රතිනිර්මාණය කරමින් සේවක භාරකාර අරමුදල් පද්ධතිය සම්පූර්ණ කරන ලදි. මීට අමතරව, සේවක භාරකාර අරමුදල් මණ්ඩලය සඳහා ගිණුම් පැකේජය (ACCPAC) මිලදී ගන්නා ලදි.

10	රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව (GAD) සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුම	රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි කිරීම. නිසි තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුම් හඳුන්වා දීම මගින් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන්ට සහ පුරවැසියන්ට විවිධ ආකාරවලින් ප්‍රතිලාභ ලැබෙනු ඇත.	2016 - 2022	40.00	26.52	25%	මූලික පද්ධති අවශ්‍යතා ඇගයීම මත පදනම්ව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පද්ධතිය නිර්මාණය කර ඇත. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර ජාල පද්ධති යටිතල පහසුකම් සංවර්ධනය සම්පූර්ණ කර ඇති අතර අදාළ කාර්ය මණ්ඩලය පුහුණු කර ඇත.
11	ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් (NSDI) - අදියර II	අවකාශීය දත්ත හුවමාරු කර ගැනීම සඳහාත්, රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ සාමාන්‍ය ජනතාව සඳහා ඵලදායී තීරණ ගැනීම සඳහාත් තනි පද්ධතියක් සංවර්ධනය කිරීම.	2016 - 2022	530.00	175.27	90%	1) ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් පද්ධතියේ I සහ II අදියරයන් සාර්ථකව සම්පූර්ණ කර ක්‍රියාත්මක වේ (www.nsdi.gov.lk). 2) ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් ප්‍රතිපත්තිය ඉඩම් අමාත්‍යාංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව හරහා හඳුනාගත් ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහයෝගීත්වයෙන් සම්පූර්ණ කරන ලදි. 3) ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර සකස් කරනු ලබන 2022-24 කාලසීමාව සඳහා ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් මාර්ග සිතියම සහ ජාතික

								අවකාශීය දත්ත යටිතල පහසුකම් ලේකම් කාර්යාලය සඳහා වන අතුරු විධිවිධාන දැනටමත් සකසා අවසන් කර ඇත.
12	ඊ පාර්ලිමේන්තුව	මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තුවට පරිශීලක - හිතකාමී ආකාරයෙන් තොරතුරු / ලේඛනකරණය කාලීනව සැපයීම තවදුරටත් ශක්තිමත් කිරීම සහ ඉලෙක්ට්‍රොනික ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS) ස්ථාපනය කිරීම තුළින් පාර්ලිමේන්තුවේ තොරතුරු කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම.	2017 - 2022	185.00	31.58	50%	මූලික පද්ධති අවශ්‍යතා ඇගයුම මත පදනම්ව e-Parliament ඉලෙක්ට්‍රොනික පාර්ලිමේන්තු පද්ධතිය සකසා ඇත. දැනට තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර උපදෙස් ලබා ගැනීමෙන් පද්ධති අවශ්‍යතා අධ්‍යයනයන් තවදුරටත් විශ්ලේෂණය කර වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. (පද්ධති අවශ්‍යතා අධ්‍යයනය දැනටමත් සම්පූර්ණ කර ඇත).
13	දැනුම වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් පුස්තකාල	පුරවැසියන්ට ඉලෙක්ට්‍රොනික තොරතුරු / ඉලෙක්ට්‍රොනික පොත් සහ අධ්‍යාපනික ද්‍රව්‍ය ඵලදායී ලෙස භාවිතය සඳහා පහසු හා දැරිය හැකි ප්‍රවේශයක් ලබා දීම සහ ප්‍රවර්ධනය කිරීම.	2017 - 2022	225.00	66.41	91%	පුස්තකාල 26 ක මෙම පද්ධතිය ක්‍රියාත්මක කර ඇත.
14	තාක්ෂණ කර්මාන්ත සංවර්ධන වැඩසටහන	තොරතුරු තාක්ෂණ BPM කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සහ නව තාක්ෂණය පදනම් කරගත්	2021 - 2024	759.00	0.50	55%	විදේශීය තානාපති කාර්යාල සම්බන්ධ කර ගනිමින් ක්‍රියාවලියක් ආරම්භ කරන ලද අතර අපනයන වෙළඳපොලේ ස්ථානගත කිරීම සඳහා සමාගම් පැතිකඩ අරඹන ලදි. ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සඳහා

		ව්‍යාපාර හරහා ඒකියා අවස්ථා වැඩි කිරීම					බහුජාතික සමාගම් (MNCs) 6ක් සමඟ ජාතික ඩිජිටල් මූලායායතන සමූහ පවත්වන ලදි. වෙළඳපල ප්‍රවේශ අවස්ථා සඳහා සමාගම් 09 ක් සහාය පළ කරන ලදි. විදේශ දූත මණ්ඩල සඳහා හැඳින්වීම් [ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව, අබුඩාබි, ඩුබායි, කෙන්යාව, ජෝර්දානය.
15	ආරම්භක සහ පරිමාණ වැඩසටහන	ශ්‍රී ලංකාවේ තාක්ෂණ කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම	2021 - 2024	625.00	2.58	50%	Sporulation, විකල්ප බැර රාමු (Alternative Credit Framework) යනාදිය හරහා ඇරඹුම් 26ක් සඳහා අරමුදල් වෙත ප්‍රවේශය ලබා දී ඇත. ඇරඹුම් පරිසර පද්ධතිය, ආධාරක පද්ධතිය, විකල්ප බැර රාමු, පරිසර පද්ධති ඇගයීම් පිළිබඳව 1400 කට අධික ප්‍රේක්ෂකයින් පිරිසක් සඳහා බහුවාර සැසි පවත්වන ලදි. බහුවිධ ඇරඹුම් හරහා ඇරඹුම් 32ක් සඳහා ඉන්කියුබේටර සහ ඇක්සලරේටර වෙත ප්‍රවේශය ලබා දී ඇත.
16	ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය, අධ්‍යාපනය සහ බීජෞෂණ	තාක්ෂණ ඇරඹුම් පරිසර පද්ධතියෙහි (Tech Startup Eco-System) තරඟකාරිත්වය සහ ආදායම වැඩිදියුණු කිරීම	2021 - 2024	337.61	0.06	2%	ඩිජිටල් සංචාරකයා විසින් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 3කට (නැගෙනහිර, රුහුණු, මධ්‍යම) සහ තොරතුරු සන්නවේදන තාක්ෂණ නියෝජිතායතනයේ පරිසර පද්ධති හවුල්කරු වන YarlIT සහ NCIT

	(incubation) වැඩසටහන						වෙත ගොස් ප්‍රථම වරට නයිජීරියාවේ සමාගම් රෙජිස්ට්‍රාර් (ROC) සමඟ ව්‍යාපාර ලියාපදිංචි වන ආකාරය පිළිබඳව සොයා බලන ලදි.
17	ප්‍රාදේශීය පොකුරු සංවර්ධනය	ව්‍යවසායකත්ව, නවෝත්පාදන, තාක්‍ෂණික විසරණය සහ ප්‍රදේශයන්හි තාක්‍ෂණය පදනම් කර ගත් රැකියා තවදුරටත් ප්‍රවර්ධනය කෙරෙන ඵලදායී ලෙස ක්‍රියාත්මක වන ප්‍රාදේශීය තාක්‍ෂණ පොකුරු සඳහා හිතකර පරිසර පද්ධතියක් ස්ථාපනය කිරීම.	2021 - 2024	163.00		20%	යාපනය තාක්ෂණ විසරණ කොටුව ක්‍රියාත්මක වෙමින් පවතී. තාක්ෂණය පදනම් වූ ඉන්කියුබේටර ඇතුළුව පොකුරු වශයෙන් පිහිටුවා ඇති ජාතික නවෝත්පාදන සහ ඉගෙනුම් මධ්‍යස්ථාන (NILC) සඳහා සංකල්ප සංවර්ධනය කරන ලදි. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සහයෝගයෙන් මෙල්බර්න් විශ්ව විද්‍යාලය, මදුරාසියේ IIT සහ ඕස්ට්රේලියාවේ RMIT සමඟ රැස්වීම් පවත්වන ලදි.
18	ඉලෙක්ට්‍රොනික උරුම (e-Heritage) ව්‍යාපෘතිය: උරුම තොරතුරු සඳහා අති නවීන තාක්ෂණය	නවෝත්පාදන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් භාවිත කරමින් සංචාරකයින් සඳහා තමන් උනන්දුව දක්වන ස්ථාන පිළිබඳ පිහිටීම පදනම් කරගත් තොරතුරු සපයන ජංගම දයෙදුම් සහ වෙබ් සේවා සහිත ඉලෙක්ට්‍රොනික උරුමය (e-Heritage) රාමුවක් මෙම ව්‍යාපෘතිය මගින් සකසනු ඇත.	2016 - 2022	102.10	21.84	95%	ශ්‍රී ලංකා උරුම (Heritage Sri Lanka) ජංගම සහ වෙබ් යෙදුම් සංවර්ධනය කරන ලද අතර එය මහජනයාගේ පහසු භාවිතය සඳහා පවතී. පොළොන්නරුව, අනුරාධපුරය, ගාල්ල, මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල උරුම ස්ථාන, ස්මාරක, ව්‍යුහයන් සහ ගොඩනැගිලි ලැයිස්තු සකස් කරනලදි.

19	රජයේ ඩිජිටල් පරිවර්තනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ මානව සම්පත් ධාරිතා ගොඩනැගීම - ඉලේට්‍රෙනික ඉගෙනුම් පද්ධතිය (eLearning Platform)	පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවාවන් ඵලදායි ලෙස ලබාදීමට හැකි වන පරිදි සෑම මට්ටමකම රාජ්‍ය අංශයේ සේවකයන් අතර අවශ්‍ය හැකියාවන් සවිබලගැන්වීම සහ ගොඩනැගීම.	2016 - 2022	382.00	74.39	96%	රජයේ නිලධාරීන් වෙත තම ඉගෙනුම් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම උදෙසා රජයේ ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් පද්ධතියක් සංවර්ධනය කර යොදවන ලදි. ප්‍රධාන තොරතුරු නිලධාරීන් 30 දෙනෙකු විසින් පාලනය පිළිබඳ ප්‍රධාන වැඩසටහන සම්පූර්ණ කරන ලදි. නව තාක්ෂණයන් ඵලදායී ලෙස භාවිත කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ToT වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 20+ ක් පවත්වන ලදි. කළමනාකරුවන් 600+ ක් රජයේ සහ අදාළ දැනුම් විෂයය පථයන් පිළිබඳ දැනුම සහ නිපුණතා වන්ගෙන් සන්නද්ධ කරන ලදි.
20	සුහුරු සමාජය සහ පුරවැසි හැකියා ගොඩනැගීම	මතු වෙමින් පවතින තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් සදාචාරාත්මක සහ වගකීමෙන් යුතුව පුරවැසි සවිබල ගැන්වීම උදෙසා භාවිත කිරීමේ කාර්යය සඳහා දරන සමාජ ප්‍රයත්නයකට මෙම ව්‍යාපෘතිය මගින් හැකියාව ලබා දෙනු ඇත. තවද, මෙමගින් සියලුම සමාජ මාධ්‍ය සහ වර්ධනය වෙමින් පවතින තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ භාවිතය දිරිමත් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය උපායමාර්ගික, තාක්‍ෂණික සහ වාණිජමය පදනමක් සපයනු ලබන අතර තොරතුරු හා සන්නිවේදන	2017 - 2022	154.00	50.22	94%	සුහුරු සමාජ කව 860 ක් පමණ පිහිටුවන ලදි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා දැනුම් නියෝජිතයන් ලෙස තරුණයින් 4600 ක් ඔවුන්ගේ ගම්වලට අනුයුක්ත කරන ලදි. මේ වන විට කාන්තා ව්‍යවසායකයින් 1925 දෙනෙකු පුහුණු කර ඇත. සමාජ මාධ්‍ය මෙවලම් ඵලදායී ලෙස භාවිත කිරීම පිළිබඳව 8000+ පුරවැසියන් සංඛ්‍යාවක් මුහුණු පොත (Facebook) සමඟ සහයෝගිත්වය සහිතව පුහුණු කරන ලදි.

		තාක්‍ෂණය තුළින් ජාතියේ බුද්ධිමය, සංස්කෘතික සහ සාමාජීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පරිසරයක් සකස් කෙරේ.					
21	ඉලෙක්ට්‍රොනික ස්වාභිමානි වාර්ෂික වැඩසටහන සහ ආශ්‍රිත ක්‍රියාකාරකම්	සමාජය මත ප්‍රබල බලපැමක් ඇති දේශීය ඩිජිටල් යෙදුම් සැකසුම්කරුවන්ගේ නිර්මානශීලීත්වය සහ හැකියාවන් හඳුනා ගැනීම සඳහාත්, එමඟින් ඔවුන්ගේ නිෂ්පාදන ජාතික වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් විදහා දැක්විම සඳහා ඔවුන්ට අවකාශයක් සැළසීමත් මෙම ව්‍යාපෘතියෙන් සිදුවේ.	2017- 2021	30.00	33.01	90%	අගෝස්තු 25 දින නම් කිරීම් අවසන් වීමත් සමඟ මෙම වර්ෂයේ ඉලෙක්ට්‍රොනික ස්ව අභිමානී සම්මානයන් සදහා අයදුම්පත් 340 ක් ලැබිණි. මහා පරිමාණ විනිෂ්චය කිරිමක් මාර්ගගතව (පළමුවරට) සැප්තැම්බර් 10 - 12 කාලසීමාවේදී පවත්වන ලදි. (විනිශ්චය සහික සාමාජිකයින් 18) (ජයග්‍රාහකයින් 50+ ක් කෙටි ලැයිස්තුගත කරන ලදි.)
22	ඩිජිටල් පරිවර්තනය සඳහා ප්‍රතිඵල පාදක සැලසුම් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම ක්‍රියාත්මක කිරීම.	ඩිජිටල් පරිවර්තන ක්‍රමෝපායයේ සංවර්ධන ප්‍රතිඵලවල ප්‍රගතිය සඵලදායී ලෙස මැනීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අධීක්ෂණ හා ඇගයීමේ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම උ අධීක්ෂණ හා ඇගයුම් පද්ධතියෙන් අරමුණු කෙරේ.	2021 - 2024	198.84	0.05	40%	1) ලෝක බැංකුවේ CERC අරමුදල් ලබන ව්‍යාපෘති පිළිබඳ මූලික අධ්‍යයනය සිදු කර අවසන් කරන ලදි. 2) යොදා ගැනීමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා සාක්ෂි පාදක යෙදවුම් සැපයීම සඳහා forms.gov.lk වේදිකාවේ අරමුදල් ලබන CERC මගින් සකස් කෙරේ. 3) තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ආයෝජන

							පාලන ක්‍රියාවලිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි. 4) ප්‍රතිඵල පාදක කර ගත් කළමනාකරණ ප්‍රවේශයක් යොදා ගනිමින් NPD වෙත ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අඛණ්ඩ සහයෝගය.
23	ඩිජිටල් පරිවර්තනය සඳහා උපාය මාර්ගික සන්නිවේදනය	සමාජයේ සියළු කොටස් විසින් සඵලදායී ලෙස තාක්ෂණය යොදා ගැනීම කරා පුද්ගල හා සාමාජීය චර්යා වෙනස් විම් කෙරෙහි බලපෑම් කිරීමෙන් ජාතික ඩිජිටල් පරිවර්තන ක්‍රමෝපායට සහාය දැක්වීම උපාය මාර්ගික සන්නිවේදන සැලැස්මේ අරමුණවේ.	2021 -2024	170.78	0.18	40%	1) ජන සන්නිවේදන දැනුවත් කිරීමේ ව්‍යාපාරය - ප්‍රසම්පාදනය ආරම්භ කරන ලදි. 2) ඩිජිටල් මාධ්‍ය දැනුවත් කිරීමේ ව්‍යාපාරය - ට්විටර් - ට්විටර් භාවිත කරන්නන් 69, ලාංජන 23,300. 3) 2022 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන වෙබ් අඩවිය අළුත්වැඩියා කිරීම - ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී. 4) 2022 අවසන් වනවිට සම්පූර්ණ කරන ලද මහජන සම්බන්ධතා කටයුතු - රූපවාහිනි සම්මුඛ සාකච්ඡා - 1. රූපවාහිනී ප්‍රවෘත්ති සංක්ෂිප්ත - 65) 2024 අවසන් වනවිට සම්පූර්ණ කරන ලද ජන මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය නිරතවීම් - ආරම්භ කිරීමට ඇත.

මූලාශ්‍රය * **ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය**

9. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT)

9.1 ව්‍යාපෘති සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය සහ අනාගත සැලැස්ම

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති කාල සීමාව	තාක්ෂණික ඇගයුම් කමිටුවේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	සමුච්චිත වියදම්. (රු. මිලියන)	භෞතික ප්‍රගතිය (%)
1.	ජාතික සහතික කිරීමේ අධිකාරිය (NCA)	2021-2023	830.25	66.54	නිෂ්පාදන දත්ත මධ්‍යස්ථානය සහ අධීක්ෂණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ දෘඩාංග සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කර ඇත. 2019-2022 කාලය තුළ ආරම්භ කරන ලද සියලුම ප්‍රසම්පාදන අයවැය සීමාවන් හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි විය.
2.	තොරතුරු සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ ජාතික සමීක්ෂණය	2020-2022	130.00	0.13	අභිලාශය ප්‍රකාශ කිරීමේ (EOI) ඇගයීම සම්පූර්ණ කර යෝජනා සඳහා ඉල්ලීම (RFP) නිකුත් කරන ලදි. යෝජනා සඳහා ඉල්ලීම (RFP) ඇගයීම සම්පූර්ණ කරන ලදි. රාජ්‍ය ආයතන දෙකක් (ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව) සමඟ අවබෝධතා ගිවිසුම (MOU) අත්සන් කරන ලදි. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදයක් ඇති වූ අතර අයවැය සීමාවන් හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය

					කිරීමට නොහැකි විය. එබැවින් අනාගත කටයුතු වලට මෙය සැලකිය යුතු අන්දමින් බලපානු ඇත.
3.	සයිබර් ආරක්ෂණ ධාරිතාව සහ යටිතල පහසුකම් සංවර්ධනය	2019-2023	58.9	24.00	ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ වෘත්තිකයන්ගේ සැපයුම සහ ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ; තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් (CII) පවත්වාගෙන යන සංවිධානවල සූදානම සහ තොරතුරු සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ රාජ්‍ය නිලධාරීන්ගේ දැනුවත්භාවය සම්පූර්ණ කර ඇත. වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවගේ තොරතුරු සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ පුරවැසියන්ගේ සංජානනය සහ තොරතුරු සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ නියමු අධ්‍යයනයක් සඳහා වන සමීක්ෂණ ප්‍රශ්නාවලිය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) විසින් අවසන් කර ඇති අතර අයවැය සීමාවන් හේතුවෙන් එය රඳවා තැබීමට සිදු විය.
4.	සයිබර් ආරක්ෂාව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා වෙබ් ද්වාරය (portal) නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම	2020-2023	8.5	2.5	වෙබ් ද්වාරය (Web Portal) සම්පූර්ණ කර ඇති අතර සහාය සහ නඩත්තුව සිදු වෙමින් පවතී.
5.	තොරතුරු සහ සයිබර් ආරක්ෂාව සඳහා ජාතික නිපුණතා ප්‍රමිතීන් සංවර්ධනය කිරීම	2020-2021	9.50	1.7	CERT සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අතර අවබෝධතා ගිවිසුම (MOU) අත්සන් කරන ලදි. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටම ප්‍රකාශයට පත් කරන ලදි. ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමේ විෂය මාලාව සකස් කර විෂයමාලා සමාලෝචනය සිදු වෙමින් පවතී.

6.	රජයේ නිලධාරීන් සඳහා ඉලෙක්ට්‍රොනික ඉගෙනීම(e-Learing) පිළිබඳ මාර්ගගත මොඩියුල සංවර්ධනය කිරීම	2020-2022	30.00	2.65	විෂයමාලා සංවර්ධනය සඳහා උපදේශකයකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබේ. මොඩියුල 5ක් සඳහා විෂයමාලා සංවර්ධනය කෙටුම්පත් කර සමාලෝචනය සිදු කෙරේ. මොඩියුල 6 ක් සඳහා විෂයමාලා සංවර්ධනය සිදු වෙමින් පවතී.
7.	සයිබර් ආරක්ෂණ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන - රජයේ නිලධාරීන් 10,000ක් පුහුණු කිරීම	2020-2023	59.00	0.85	තාක්ෂණ අමාත්‍යාංශයෙන් සහ (විදේශ සම්පත් දෙපාර්තමේන්තුව) ERD වෙතින් ලබාගත් අවබෝධතා ගිවිසුම සඳහා අනුමැතිය. අවබෝධතා ගිවිසුම අත්සන් සඳහා CISCO වෙත යවා ඇත. 3. කෙසේ වෙතත්, ආසන්න වශයෙන් රාජ්‍ය නිලධාරීන් 50 දෙනෙකු සඳහා පුහුණු කිරීම් ආරම්භ කරන ලදි.

මූලාශ්‍රය * **ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

සයිබර් ආරක්ෂණ කළමනාකරණය

- **සයිබර් ආරක්ෂණ උපායමාර්ගය** (2019-2023) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් හඳුන්වා දී ඇති අතර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහපත් ව්‍යවහාරයන් පවත්වා ගනිමින් සයිබර් ආරක්ෂණ තර්ජන සහ සිදුවීම් ඵලදායිවත්, කාර්යක්ෂමවත් වළක්වාලීමට, අවම කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවත්නා මෙම උපාය මාර්ගය උපකාරී වනු ඇත.

- රාජ්‍ය ආයතන සඳහා වන **සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය** 2022 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. අනිටු ක්‍රියාකාරීන් විසින් ඩිජිටල් පද්ධති අනිසි ලෙස භාවිත කිරීමේ අවදානම සහ විවිධ සයිබර් තර්ජන වැළැක්වීමට එය උපකාරී වනු ඇත.

- **සයිබර් ආරක්ෂණ පනත (යෝජිත)**

- පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපෝෂණය සඳහා යැවීම උදෙසා අවසන් කර ඇති අතර එය කඩිනමින්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

10. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

10.1 ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ව්‍යාපෘති සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය සහ අනාගත සැලසුම්

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති කාලසීමාව	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	සමුච්චිත වියදම්. (රු. මිලියන)	භෞතික ප්‍රගතිය
1	විස්තීර්ණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (CMIS)	2018 - 2023	මිලියන 95	මිලියන 2.8	වට්ටෝරු භාණ්ඩ පාලනය, ස්ථාවර වත්කම් කළමනාකරණය සහ ප්‍රසම්පාදනය ඇතුළු **මූල්‍ය ගිණුම්කරණ මෘදුකාංග**: පවතින තොගයෙන් බැහැර මෘදුකාංග විසඳුමක් ප්‍රසම්පාදනය කර පුහුණුව ලබා දී ඇත. එය දැනට ක්‍රියාත්මක වන අතර වෙනස් කිරීම් ඉල්ලීම් (Change Requests) සිදු කෙරෙමින් පවතී. **මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS)** වැටුප් ලේඛනය, නිවාඩු සහ අදාළ ඒකාබද්ධතාවන් සමඟ පැමිණීම - ක්‍රියාකාරී අවශ්‍යතා පිරිවිතර සමාලෝචනය කර ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී. තාක්ෂණික අංශ 4 සඳහා මෘදුකාංග විසඳුම් 2023 වසරේදී ආවරණය වනු ඇති අතර 2024 වර්ෂයේ දී තාක්ෂණික අංශ 6 ආවරණය කරනු ඇත.
2	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය	2021-2022	මිලියන 20		ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී - විකුණුම්කරු ඇගයීම සිදු කර ඇත.

*ප්‍රභවය : ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

SRI LANKA STANDARDS INSTITUTION
GUARDIAN OF QUALITY

11. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)

11.1 ව්‍යාපෘතිවල සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය හා අනාගත සැලසුම්

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති කාලසීමාව	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	සමුච්චිත වියදම්.	භෞතික ප්‍රගතිය
1	කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය	2012 ජන - 2022 ජූනි	ඇ.ඩො. මිලියන 113.7	ඇ.ඩො. මිලියන 111.95 (98.5%)	95% සම්පූර්ණ කර ඇත.
2	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නව ගොඩනැගිලි ව්‍යාපෘතිය	2018 ජන - 2022 මාර්තු	රු. මිලියන 213	රු. මිලියන 101 (48.32%)	•රජයේ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල සංදේශය සැකසීම
3	කදිරාන පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ සහ පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය	2018 - 2022 ජූනි	රු. මිලියන 153	රු. මිලියන 75 (49%)	• ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලැස්මක් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටු ඒකකය සහ කොන්ත්‍රාත්කරුගේ ඒකාබද්ධ සංචාරය.
4	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සූර්ය බල ව්‍යාපෘතිය	2021 - 2022 මාර්තු	රු. මිලියන 40	-	• ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් යෝජනාවක් ඉල්ලා සිටීම

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

- **“ගමට සන්නිවේදය” සම්බන්ධ කිරීමේ ශ්‍රී ලංකා ජාතික ව්‍යාපෘතිය** - තාක්ෂණය පදනම් වූ සමාජයක් (සුහුරු ජාතියක්) සහ ඩිජිටල්මය වශයෙන් සම්බන්ධිත ශ්‍රී ලංකාවක් පිළිබඳව රජයේ දැක්මට සමාන්තරව රටේ ඩිජිටල්කරණ පරිශ්‍රමය සඳහා අත්‍යවශ්‍ය වන 4G / ෆයිබර් බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණයක් රට පුරා ඇති කිරීමේ පරමාර්ථය සහිතව”, රටේ එම සේවය සළසා නැති ප්‍රදේශ හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් “ගමට සන්නිවේදනය” ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ අවසානය දක්වා පවතිනු ඇත.

- **ෆයිබර් සම්බන්ධතාවය මගින් පාසල් 10,155ක් සඳහා බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාව ලබාදීම** - සුහුරු පන්ති කාමර ප්‍රචලිත කිරීම සඳහා දිවයින පුරා පාසල් 10,155ක් වෙත අන්තර්ජාල සම්බන්ධතාව ලබා දීමෙන් දුරස්ථ ඉගෙනුම් අවස්ථා ලබාදීමටත්, එමගින් සමස්ත ශිෂ්‍ය ප්‍රජාවටම සමාන අධ්‍යාපනික අවස්ථා ලබාදීමටත් මින් අරමුණු කෙරේ.

- **ෆයිබර් ව්‍යාප්තිය සහ 5G තාක්ෂණය සඳහා අවශ්‍ය නිෂ්ක්‍රීය යටිතල පහසුකම් සක්‍රීය කිරීම** - දැනට පවත්නා දෑ භාවිත කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ අනෙකුත් ජාලකරණ සේවා සැපයුම්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. මෙමගින් සමෘද්ධිමය දර්ශනයේදී ඉලක්ක කරගත් පරිදි 5G තාක්ෂණය වේගයෙන් සහ වඩා කාර්යක්ෂමව ව්‍යාප්ත කිරීමට හැකි වනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
TELECOMMUNICATIONS REGULATORY COMMISSION OF SRI LANKA

12. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය (SLT)

12.1 ව්‍යාපෘති සහ ක්‍රමලේඛකයින්ගේ ප්‍රගතිය සහ අනාගත සැලසුම්

අංකය	ව්‍යාපෘතිය / ආයතනය	මුළු පිරිවැය (රු. මිලියන)	ව්‍යාපෘති කාල සීමාව සිට දක්වා (මාසය / වර්ෂය)	සමුච්චිත වියදම (2022.09.30 දක්වා)	භෞතික ඉලක්ක සහ ප්‍රගතිය		
					ව්‍යාපෘතියේ සමස්ත භෞතික ඉලක්කය (අපේක්ෂිත නිපැයුම්) (අ)	භෞතික ඉලක්ක සහ ප්‍රගතිය - 2022	සමුච්චිත භෞතික ඉලක්කය (%)
		ලූ	ලූ			2022 සඳහා සවිස්තරාත්මක ඉලක්කය (ආ)	
1	ෆයිබර් ප්‍රවේශ ජාලයේ වේගවත් ව්‍යාප්තිය - III අදියර	50,580	2019 - 2023	4715		460 K පෝට් (ports)	75%
2	ෆයිබර් ජාල පුළුල් කිරීම	5,249	2019 - 2023	381		ව්‍යාපෘතිය 100% අවසන් කිරීම	75%

3	SMW 6 සබ්මැරීන් කේබල් පද්ධතිය ක්‍රියාත්මක කිරීම	9,153	2022 - 2025	3506		ව්‍යාපෘතිය 43% අවසන් කිරීම	75%
4	ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීම 2021	1,547	2022 - 2023	297		ව්‍යාපෘතිය 100% අවසන් කිරීම	75%
5	LTE පුළුල් කිරීමේ අදියර II	600	2019 - 2024	41			75%
6	වැලිකඩ ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහය සඳහා මෙහෙයුම් මූලස්ථාන ගොඩනැගිල්ල සැලසුම් කිරීම සහ ඉදිකිරීම	1,950	2021 - 2022	666		සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීම	75%
7	පිටිපන දත්ත මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමේ අදියර 2	650	2019 - 2022	159		සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීම	75%
8	ISP පවතින PCEF ව්‍යාප්තිය 2021	200	2021 - 2022	58		සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීම	75%

අනාගත සැලසුම් - ශ්‍රී ලංකා ටෙලිකොම්

1. ජාතික ප්‍රධාන ජාලය

2. නිවසට තන්තු (FFTH) රෝල්අවුට් [Fiber to the Home (FFTH) Rollout]

3. 4G LTE Rollout

4. 5G LTE Rollout

5. SEA-ME-WE 6 (SMW6)

   SEA-ME-WE 6 ආයෝජන; මෙය ප්‍රංශය සහ සිංගප්පූරුව අතර ශ්‍රී ලංකාව සම්බන්ධ කරනු ලබන 6 වැනි සබ්මැරීන් කේබලයයි. ශ්‍රී ලංකා ටෙලිකොම් දැනටමත් කලින් ක්‍රියාත්මක කරනු ලබන SEA-ME-WE 3, SEA-ME-WE 4 සහ SEA-ME-WE 5 සබ්මැරීන් කේබල්වල සමූහායතන හවුල්කරුවෙකි.

6. දත්ත මධ්‍යස්ථානය සහ මේඝය (Cloud)

7. තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම

8. මෘදුකාංග සහ ඩිජිටල් විසඳුම්